# ජීවිතය හා ක්‍රීඩාවඃ චීන අත්දැකීම්

ආර්.පී.එච්.ආර්. ජයසේකර

අතීතයේ පටන් ම ශ්‍රී ලංකාව හා චීනය අතර මිත්‍ර සම්බන්ධතාවයක් පවතී. එහී දී ශ්‍රී ලංකාව හා චීනය අතර සාරධර්මයන් හි පවත්නා සබැඳියාව තව දුරටත් නිරූපණය වේ. මෙහී දී ක්‍රීඩාව සහ විශ්‍රාන්තිය සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකාව හා චීනය සමීපත්වයට පත් වන දක්නට ලැබේ. "සිත් පහන" නම් වු කෘතිය ශ්‍රී ලංකාව හා චීනය අතර මිත්‍ර සම්බන්ධතාවයට බෙහෙවින් පිළිතුරු දක්වයි. මෙම ග්‍රන්ථය චීනයට ආවේණික සංස්කෘතික සම්ප්‍රදාය, දර්ශනවාදී චින්තනය හා සාරධර්ම මුලික කරගෙන ලියුවකි. "සිත් පහන" කෘතිය පිටු 267කින් සමන්විත වන අතර මෙහි අඩංගු කතන්දර 61 මඟින් මෙහි ලේඛිකාව වන ෂෙං ලී නම් කතුවරිය 2013 ජුනි මාසයේ දී චීන බසින් ලියු මෙම ග්‍රන්ථය සමන් අතාවුදටේටි මහතා විසින් ශ්‍රී ලංකික පාඨකයන් වෙනුවෙන් චීනයේ සංස්කෘතික සම්ප්‍රදාය, බුදු දහම, දර්ශනවාදී චින්තනය, ක්‍රීඩාව පිළිබඳව රසබර අධ්‍යාත්මික සංග්‍රහයක් පිළියෙල කර ඇත්තේ තමන් ලද ජීවිතාවබෝධය මුසු කරගෙනය. එහී දී මෙම කතුවරියගේ ග්‍රන්ථය තුළ දී ක්‍රීඩාව සහ විශ්‍රාන්තිය සම්බන්ධයෙන් අපුර්ව වු සටහන් කිහිපයක් දක්වා ඇත. එමඟින් චීනයේ පවත්නා ක්‍රීඩා සහ විශ්‍රාන්තිමය රටා කෙසේ නම් පවතී ද යන්න පිළිබඳව තීරණය කළ හැකි වේ. මෙහි අඩංගු " මමත්වය අත්හැරියහොත් " නම් වු කථාවෙහි ක්‍රීඩාව සහ විශ්‍රාන්තිය සම්බන්ධ අපුර්ව වු සටහනක් කතුවරිය විසින් දක්වා ඇත."ජෙට් ලී, සුප්‍රකට කුං ෆු නළුවන් වන බෘෘස් ලී සහ ජැකී චැන් මෙන් ම දක්ෂ චීන කුං ෆු නළුවෙකි........." කතුවරිය මෙමඟින් මුලික කථා වස්තුව ආරම්භ කරනු ලබයි. එහී දී ජෙට් ලී තමන්ගේ ජීවන අත්දැකීම් අළලා ලියු ලිපියක් ඇය මෙහි කථා වස්තුව බවට පත් කරගෙන තිබේ."මා කුං ෆු ඉගෙනගන්න පටන් ගන්නේ වයස අවුරුදු 8 දී ය. අවුරුදු 11 සිට වසර 5ක් පුරාම කුං ෆු තරඟවලින් රන් පදක්කම් හිමි කරගත්තා. අවුරුදු 5ක් තිස්සේ මා කුං ෆු පිළිබඳ රන් පදක්කම් ලබා ගත්තා. මේ විදිහට දිගින් දිගටම රන් පදක්කම් දිනා ගන්න ගියොත් කවදා හරි වෙන කෙනෙක් මාව පරදවන දිනය එළඹෙනවාට සැකයක් නැත.""ජෙට් ලී" නම් වු අග්‍රගන්‍ය ක්‍රීඩකයාගේ අපුර්ව ජීවිත කථාවෙහි එක් සංසිද්ධිමය අවස්ථාවක් කතුවරිය විසින් මුලික තේමාව බවට පත් කරගෙන තිබුණි. ජෙට් ලී නම් වු දක්ෂ චීන කුං ෆු ක්‍රීඩකයෙක්, නළුවෙක් වැනි පුද්ගලයෙක් තමන්ගේ ජීවිතාවරණය ඉදිරිපත් කරන්නේ ඉතාමත් අපුර්ව ලෙසිනි. පාඨක ජනයාට තමන්ගේ ජීවිතවල ජීවිතාවබෝධය අවශ්‍ය මාර්ගෝපදේශනය ලබාදෙන්නට කතුවරිය යොදාගනු ලැබුවේ ක්‍රීඩකයකුගේ ජීවිත අත්දැකීමකි. ක්‍රීඩකයකුට තමන්ගේ ජීවිතයට ලබාගත හැකි අත්දැකීම් ගණනාවක් පවතී. එහෙයින් ඔහුගේ ජීවන අත්දැකීම් මඟින් මාර්ගෝපදේශනයක් ලබාදීම ඉතා වැදගත් බව කතුවරියට වැටහෙන්නට ඇතැයි යන්න මාගේ අදහසයි. මිනිසෙකුට තමන්ගේ ජීවිතයට අවවාද, උපදෙස් ලබා ගැනීම ඉතා වැදගත් වේ. එහී දී සිත් පහන නම් වු කෘතිය මඟින් පුද්ගල ජීවිතයට උපදේශනය ලබාදීමට ලියා තැබු කෘතියකි. එහි තවත් කථාවක් වන "විනාඩි දහයක ජීවිතය" නම් වු කථාව පුද්ගල ජීවිතයට අපුර්ව වු උපදේශනයක් ලබාදෙන්නකි. මිනිසුන් නිරතුරුවම මුදල් පසුපස හබා යන්නේ ඉතා වේගයෙනි. එනමුත් ඔවුන් හරිහම්බ කරගන්නා වු එම මුදල් වියදම් වන්නට ගතවන්නේ ඉතා සුළු වේලාවකි යන්න පැහැදිලි කිරීම සඳහා කතුවරිය පහත අයුරින් ක්‍රීඩාව යොදාගෙන තිබේ."පියා සහ පුත්‍රයා සෙල්ලමක නිරත වීමට සුදානම්ව සිටියා. එම සෙල්ලමේ දී කෙනෙකුට ලැබෙන කාලය විනාඩි දහයකට සීමා වී තිබුණා. එය ඔවුන් හැඳින්වූයේ "ජීවිත කාලය" ලෙසයි. විනාඩි දහය තුළ පියා සහ පුත්‍රයා වෙන් වෙන්ව පොතක් පෙරළමින් එම පොතෙන් "රන් " යන වචනය සොයා ගත යුතුයි. එතකොට "රන් " යන වචනය වැඩි වාර ගණනක් සොයා ගත් අයට සෙල්ලමෙන් දිනුම ලැබෙනවා........." මිනිසුන් තමන්ගේ විශ්‍රාන්තිමය තත්වයන් සඳහා විවේක කාලය තම පවුලේ සාමාජිකයන් සමඟ යහපත් ලෙස ගත කිරීමට ක්‍රීඩාව යන්න යොදාගෙන තිබෙන බව පෙනේ. මෙහි දී කතුවරිය පියා සහ පුත්‍රයා අතර පවතින සමීප සම්බන්ධතාවය සහ ඔවුන් තම විවේක කාලයේ දී නිරතවන අපුර්ව ක්‍රීඩාවක් පිළිබඳව සඳහන් කොට තිබේ. මෙය විශ්‍රාන්තිමය අවස්ථාවක් නිරූපණය කරනු ලබන සොඳුරු සටහනකි. විශ්‍රාන්තිය, ක්‍රීඩාව, විවේකය අප ජීවිතවලට බැඳී පවතී. ඒ බැඳීම කලාව තුළින් ද රස විදීමට ලැබීම මහත් භාග්‍යයකි. ඒ භාග්‍යය "සිත් පහන" නම් වු කෘතියේ කතුවරිය අපට ලබා දී ඇත.

ෂෙං ලී, පරිවර්තන, සමන් අතාවුදටේටි,**සිත් පහන**, (2013), ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්, කොළඹ 10.